# යාචක ළමුන්ගේ සමාජානුයෝජනය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්.ඒ.ඩබ්.එල්. වික්‍රමආරච්චි
සමාජවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

ස්වභාවික මිනිසා සමාජීය මිනිසා බවට පත්කරන ක්‍රියාවලිය සමාජානුයෝජනයයි. නැත්නම් සමාජයට අනුව පුද්ගලයා හැඩගැසෙන ආකාරය සමාජානුයෝජනය වේ. මව් කුසින් උපත ලබන ළදරුවා ඉන් අනතුරුව මානව සමාජයට පිවිසීමේදී තම දෙමාපියන් වැඩිහිටියන්ගේ සම්මත ආචාර ධර්මවලට අනුව යමින් ස්වකීය පෞරුෂය ගොඩනගාගනු ලබයි. අපි අපේක්ෂිත සමාජානුයෝජනය එසේ නමුත් යාචක සමාජය තුළ දකින්නට ලැබෙනුයේ ඊට හාත්පසින්ම වෙනස් සමාජානුයෝජන ක්‍රියාවලියකි. සාමාන්‍ය සමාජානුයෝජනයේදී මවගේ චරිත ලක්ෂණ හා කාර්යභාරයන් අනුකරණය කරමින් දුවගේ පෞරුෂයත් පියාගේ චරිත ලක්ෂණ හා කාර්යභාරයන් අනුකරණය කරමින් පුතාගේ පෞරුෂයත් ගොඩ නැගේ. එහෙත් යාචක සමූහවල මව කේන්ද්‍ර කරගත් පවුල් ක්‍රමයක් බහුලව ක්‍රියාත්මක කරන බැවින් හා ඇය එම පවුලේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරන බැවින් යාචක දරුවන්ගේ සාමාජානුයෝජන ක්‍රියාවලිය කෙබඳු දැයි සොයා බැලීමට මෙම පර්යේෂණය සිදු කෙරුණි.

ඒ අනුව මෙම අධ්‍යයනය තුළින් බලාපොරොත්තු වූයේ යාචක දරුවන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලිය කෙබඳුද? යන ගැටළුව පිළිබඳව සාමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීමටයි. මොවුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය ගත් විට ඔවුන් පාසල් නොයන අතර, තම අවට සමාජයෙන් ලබන පටු දැනුමකට පමණක් සීමාවන ස්වභාවයක් දැකිය හැකිය. එබැවින් නිසි සමාජානුයෝජන ක්‍රියාවලියකට ලක් නොවන යාචක දරුවන්ගෙන් සමාජයට සිදුවන බලපෑම අවබෝධ කර ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් කෘත්‍යාත්මක ක්‍රමය යොදාගත් අතර, දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම වශයෙන් සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ ක්‍රම භාවිතා කරන ලදි. අධ්‍යයන ප්‍රදේශ ලෙස අලුත්ගම, බෙන්තර හා කැලණිය යන ප්‍රදේශ තෝරා ගත් අතර, 30 දෙනෙකුගෙන් යුත් නියැදියක් ඒ සඳහා යොදා ගන්නා ලදි.

මෙම පර්යේෂණයට අනුව පෙනී ගිය පොදු කරුණක් වූයේ මව කේන්ද්‍ර කරගෙන මෙම යාචක ළමුන් සමාජානුයෝජනයට ලක්වන බවයි. එසේම අවට සමාජයේ ඔවුන්ට ඇස ගැටෙන තමන්ගේ සමාජ තත්ත්වයේ සිටින යාචක මිතුරු සමූහ තුළින්ද සමාජානුයෝජන ක්‍රියාවලිය සිදුවේ. යාචක ළමුන්ට පාසල් අධ්‍යාපනයක් නොලැබීම හා නිසි ද්විතීය සමාජානුයෝජන කාරක නොතිබීම තුළින්ද ඔවුන් දුෂ්සමාජානුයෝජනයකට ලක් වී තිබේ. එබැවින් ඔවුන් සොරකම් කිරීම වැනි සමාජ සම්මත නොවන ක්‍රියාවලින්ටද යොමු වී ඇති බවක් දක්නට ලැබීය එසේම ඔවුන් රැකියාවක් නොකිරීම හේතුවෙන් රැකියා විරහිත තත්ත්වය තුළ සමාජයට බරක් වී පවතී. ඒ අනුව යාචක ළමා සමාජානුයෝජනය නිසි අයුරින් සිදු නොවීම හේතු කොට ගෙන සමාජය තුළ ගැටළු රැසක් පැන නැගී ඇති බව මෙමගින් අනාවරණය විය.

මුඛ්‍ය පද :- ළමයා, සමාජානුයෝජන ක්‍රියාවලිය, යාචකයා, පෞරුෂය